www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාන්ඩුව පූර්න පරිමාන යුධ වැඩ පිලිවෙලක් සඳහා ජවිපෙ සගයා සමග සාකච්ඡා කරයි

## Sri Lankan government negotiates with JVP ally on program for all-out war

**කේ. රත්නායක විසිනි**

**2006 අගෝස්තු 28**

පසුගිය මාසය පුරා මිලිටරිය සහ දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) අතර සිදු වෙමින් පවත්නා විවෘත යුද්ධය මධ්‍යයේදී ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) තම පාලක සභාගයට බඳවා ගැනීම සඳහා ක්‍රියාශීලීව සාකච්ඡා කරමින් සිටී. දෙපාර්ශ්වය අතර මෙතෙක් ගිවිසුමක් ඇති කර ගෙන නොමැති නමුදු සාකච්ඡා ඉදිරියට යාම වනාහි එල්ටීටීඊය සමග පූර්න පරිමාන යුද්ධයකටත්, කම්කරු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට හා ජීවන කොන්දේසි වලට එරෙහි බලගතු ප්‍රහාරයකටත්, ආන්ඩුව සූදානම් වන බව පිලිබඳ ඉතා පැහැදිලි සලකුනකි.

සිංහල ස්වොත්තමවාදයේ හා ජනතාවාදී පූච්චානම්වල සංකලනයක් වූ ජවිපෙ, පසු ගිය නොවැම්බර් ජනාධිපතිවරනයේදී රාජපක්ෂට සහයෝගය දුනි. එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුවේ පැවැත්ම සම්බන්ධයෙන් ගත්කල ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 39 දෙනාගේ පිටු බලය තීරනාත්මකය. තම සහයෝගය සම්බන්ධයෙන් ජවිපෙ අය කල මිල වනාහි එල්ටීටීඊයට එරෙහි වඩාත් ආක්‍රමනශීලී ඉරියව්වකි. එනම් 2002 සටන් විරාම ගිවිසුම සංශෝධනය කිරීම, මිලිටරිය ශක්තිමත් කිරීම සහ ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියා දාමයෙන් ඉවත්වීමයි.

වත්මන් සාකච්ඡා තුලදී පාලක සභාගයට එක්වීමේ පදනම ලෙස රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමග එක්ව ක්‍රියාත්මක කල යුතු කරුනු 20 ක "පොදු වැඩ පිලිවෙලක්" ජවිපෙ විසින් යෝජනා කරන ලදී. මෙම පොදු වැඩ පිලිවෙල වනාහි "සාම ක්‍රියාදාමය" මුලුමනින්ම වල දැමීම වර්ධනය කිරීමක් හා එල්ටීටීඊය හමුදාමය වශයෙන් විනාශ කිරීමේ යුද්ධය විවෘතව ප්‍රකාශයට පත් කිරීමක්වේ. එහි අන්තර්ගත ප්‍රධාන කරුනු:

* පොදු වැඩ පිලිවෙල අත්සන් කෙරුනු පසු හැකි ඉක්මනින් 2002 සටන් විරාම ගිවිසුම කටුගා දැමීම. ගිවිසුම මගින් එල්ටීටීඊයට බොහෝ සහන ප්‍රදානය කොට ඇතැයි පවසමින් ජවිපෙ එය දැඩි ලෙස විවේචනයට ලක් කල අතර එය වල දැමීම සඳහා නිරතුරුවම උත්සාහයේ යෙදින.

* ගිවිසුම අත්සන් කොට සතියකින් සාම ක්‍රියාදාමයේ විධිමත් මැදිහත්කරු වන නොර්වේ ඉන් ඉවත් කිරීම. දැනට සටන් විරාමය නිරීක්ෂනය කරනු ලබන, ස්කැන්ඩිනේවියානු රටවල් මගින් නායකත්වය දෙනු ලබන, ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව හා නොර්වීජියානු මැදිහත්කරු "එල්ටීටීඊයට පක්ෂග්‍රාහී" යැයි ජවිපෙ නැවත නැවතත් චෝදනා කොට ඇත.

* දැනට එල්ටීටීඊ පාලනය යටතේ පවත්නා ප්‍රදේශයන්හි ආන්ඩුවේ පාලනය ඇති කිරීම සඳහා ක්ෂනික පියවර ගැනීම. අත්‍යවශ්‍ය වුවහොත් හමුදාව යොදවා කෙරෙන ආක්‍රමනයකින් එය සිදු කිරීම.

* සාකච්ඡාමය සාම විසඳුමක් සඳහා දැරූ ප්‍රථම ප්‍රයත්නය ලෙස, ඉන්දු-ලංකා සාම ගිවිසුම යටතේ 1987 දී ඒකාබද්ධ කරන ලද උතුරු-නැගෙනහිර පලාත වෙන්වූ පලාත් දෙකක් ලෙස බෙදා වෙන් කිරීම. 2002 සටන් විරාමයෙන් පසු, පෙඩරල් ශ්‍රී ලංකාවක් තුල උතුරු-නැගෙනහිර පලාතට සැලකිය යුතු බලය බෙදා හැරීමක් සඳහා වන සාකච්ඡාවන් වෙනුවෙන්, වෙන්වූ රාජ්‍ය කැබිලිත්තක් සඳහා වූ තම ඉල්ලීම එල්ටීටීඊය විසින් අත් හැර දමන ලදී. මෙම බෙදා වෙන් කිරීම ඉදිරි සාකච්ඡාවන් සඳහා වන පදනම කෙරෙහි ඉමහත් ලෙස බලපානු ඇත.

එල්ටීටීඊය සමග සාකච්ඡා සඳහා ජවිපෙ විසින් ඉදිරිපත් කරන යෝජනා රටෙහි දෙමල සුලුතරයේ කවර හෝ දුක් ගැනවිල්ලකට ආමන්ත්‍රනය කිරීමට අසමත්වේ. ඔවුනට කුමන හෝ වෙනස් කමක් සිදුවුන බවද යුද්ධය පැන නැගීමට හේතුව එය බවද ජවිපෙ සරලව ප්‍රතික්ෂේප කරයි. ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ පසුගිය මාසයේදී පුවත්පත් වලට කියා සිටියේ වාර්ගික ගැටලුවක් නොතිබුනු බව හා එය හුදෙක්

"ත්‍රස්තවාදී ප්‍රශ්නයක්" බව ය. දෙමල, මුස්ලිම් සහ සිංහල ජනතාව අතර "පරිපාලනමය ප්‍රශ්න" විසඳීම සඳහා ගම් මට්ටමට විහිදෙන ඉතා සීමිත විමධ්‍යගත කිරීමක් සම්බන්ධයෙන් ජවිපෙ ඉදිරිපත් කරන සැලැස්ම එල්ටීටීඊයට කිසිසේත්ම පිලිගත නොහැකි බැව් ජවිපෙ දනී.

රාජපක්ෂ නොවැම්බරයේ සිට ජවිපෙ වැඩපිලිවෙලෙහි සැලකියයුතු කොටස් ක්‍රියාවට නගමින් සිටී. මාස ගනනාවක් පුරා හමුදාව සහ එහි අර්ධ මිලිටරි සගයන් එල්ටීටීඊය වල දැමීමේ සහ ප්‍රති ප්‍රහාරයන් ප්‍රකුපිත කිරීමේ අරමුනෙන් උතුරේ සහ නැගෙනහිරේ සැගවුනු යුද්ධයක් ගෙන ගියේය. නෝර්වේ සහ සටන් විරාම නිරීක්ෂන කමිටුව පක්ෂග්‍රාහී බවට චෝදනා කල ආන්ඩුව පෙබරවාරියේදී ජිනීවාහි පැවැති සාකච්ඡාවන්හිදී, සාකච්ඡා මුලුමනින්ම බිඳ වැටීමකට තුඩු දෙන 2002 සටන් විරාම ගිවිසුමේ සංශෝධනය කැඳවුම් කලේය.

ජූලි 26 වෙනි දා, ගොවියන්ට ජලය සැපයීමේ කඩතුරාව යටතේ, එල්ටීටීඊ පාලන ප්‍රදේශය තුල පවත්නා මාවිල්ආරු සොරොව්ව අල්ලා ගනු වස් ප්‍රධාන ප්‍රහාරයක් එල්ල කිරීමට රාජපක්ෂ අන කලේය. 2002 සටන් විරාමය විවෘතවම උල්ලංඝනය කිරීමක් වූ මෙම මෙහෙයුමෙන් දිවයිනේ උතුරු සහ නැගෙනහිර පලාත්වල අනෙකුත් කොටස් වලද ක්ෂනිකව සටන් ප්‍රකුපිත කෙරින. එල්ටීටීඊ ඉලක්කයන්ට හා ස්ථාපිතයන්ට ගුවන් ප්‍රහාර එල්ල කිරීම සඳහා මිලිටරිය විසින් මෙම අවස්ථාව ඩැහැ ගත්තේය.

ජවිපෙ යුද්ධයේදී ආන්ඩුව සමග සමීප සහයෝගීතාවෙන් කටයුතු කල අතර එහි පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශට උතුරු නැගෙනහිර යුද කලාපයේ සංචාරය කිරීම සඳහා හෙලිකොප්ටර් පහසුකම් ද සපයා දුනි. යුද්ධය සඳහා සෙබලුන්ගේ සහ සිංහල ගම් වැසියන්ගේ සහයෝගය දල්වා ලීම සඳහා ඔහු මිලිටරි කඳවුරු කීපයකට සහ ගම්මාන කීපයකට සංචාරය කලේය.

කෙසේ නමුදු, ජවිපෙ වැඩ පිලිවෙල විවෘතව වැලැඳ ගැනීමට රාජපක්ෂ මැලි කමක් දක්වයි. ජවිපෙ ආන්ඩුවට ඇතුලත් කර ගැනීම සඳහා කෙරෙන කතාබහ ජූලි මුල සිට ඇදෙමින් පවතී. ජවිපෙ ඉල්ලීම් වලට ප්‍රතිචාර දක්වමින් ජනාධිපති කියා සිටියේ සටන් විරාමයට පිටතින් කටයුතු කිරීමට හෝ විධිමත් මැදිහත්කරුගේ ක්‍රියාවලියෙන් නෝර්වේ ඉවත් කිරීමට හෝ ආන්ඩුව "හදිසි" නොවන බවයි. උතුර සහ නැගෙනහිර වෙන් කිරීම සම්බන්ධයෙන් ඔහු පෙන්වා දුන්නේ අදාල ප්‍රශ්නය සම්බන්ධයෙන් ජවිපෙ විසින් ශ්‍රේෂ්ඨාධිකරනයේ නඩුවක් පවරා ඇති හෙයින් "එය උසාවිය විසින් තීන්දු කල යුතු කරුනක්" බවයි.

රාජපක්ෂට තමාගේ පසෙකින් ජවිපෙ තබා ගැනීම අවශ්‍යය. සිංහල ස්වෝත්තමවාදයේ ගිලී සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද එල්ටීටීඊයට එරෙහිව දැඩි ඉරියව්වක් නොගැනීම සම්බන්ධයෙන් විවේචනයට ලක් වෙමින් පවතී. මේ සමගම, එල්ටීටීඊයට එරෙහිව විවෘතව යුද්ධයක් ප්‍රකාශ කිරීමට ආන්ඩුව මැලි කමක් දක්වයි. ප්‍රධාන බලයන්ගේ සහ රටතුල සහයෝගය පවත්වාගෙන යනු පිනිස රාජපක්ෂ සාමයේ මිනිසකු ලෙස තව දුරටත් පෙනී සිටී. යුද විරෝධී ව්‍යාපාරයක අඩුව තිබියදීම , පසුගිය දශක දෙක පුරා ජීවිත 65,000 කට වඩා දැනටමත් බිලිගෙන ඇති සිවිල් යුද්ධයකට නැවත රට ඇද ගෙන යාම සම්බන්ධයෙන් ජනතාවගෙන් බහුතරය විරුද්ධව සහ භීතව සිටිති.

## සමාජ නොසන්සුන්බව

යුද්ධය සම්බන්ධයෙන් සහායට අමතරව රටේ සමාජ අර්බුදයට එරෙහිව වැඩෙමින් පවත්නා ජනතා විරෝධය මැඩීම සඳහා ජවිපෙ සහය රාජපක්ෂට අවශ්‍යය. පුද්ගලීකරනයට, රැකියා වලින් දොට්ට වැටීමට සහ මිල ඉහල යාමට එරෙහිව කම්කරුවන් අතර මෙන්ම නාගරික හා ගම්බද දුගීන් අතරද වැඩෙන නොසන්සුන්තාවක් පවතී. සමාජ පුපුරායාමක දසුන මතු කරමින් යුද්ධයේ ඉහල නගින වියදමෙහි බර අනිවාර්යයෙන්ම කම්කරු ජනතාව මත දැඩිව පතිතවනු ඇත. එවන් ව්‍යාපාරයක් අවහිර කරනු වස්, විශේෂයෙන්ම ගම්බද දුගීන් අතර, ජවිපෙ බලපෑම යොදා ගැනීමට ආන්ඩුව මාන බලයි.

1960 ගනන්වලදී ගරිල්ලා ව්‍යාපාරයකින් සම්භවය ලද ජවිපෙ තවමත් ඉඳහිට ,සමාජවාදී, වෙස් මවා පාන අතර ,අධිරාජ්‍යවාදී, ඇඟිලි ගැසීම් සම්බන්ධයෙන් කුට හෙලා දැකීම් සිදු කරයි. එය තම කරුනු-20 වැඩ පිලිවෙලෙහි පූර්විකාවෙන් ,විදේශීය සතුරන්ට, සහ ඔවුනගේ දේශීය තැරැව්කරුවනට එරෙහි සටනක් කැඳවුම් කරයි. ආන්ඩුවට සමාන තැනක් එල්ටීටීඊයට ලබා දී ඇතැයි යන්න මත ජවිපෙ සාම ක්‍රියාදාමයට විරුද්ධ වන අතර ස්වෛරී රටකට යටත් විජිතයක් ලෙස සලකමින් එය පාලනය කරන්නට තැත් කරතැයි එය නෝර්වේ හෙලා දකී. ජවිපෙ නෝර්වේ හෙලා දකින අතරතුර, එල්ටීටීඊයට එරෙහි යුද්ධයට බුෂ් පරිපාලනය නිහඬව සහාය දැක්වීම හේතුවෙන් ඇෆ්ගනිස්ථානය හා ඉරාකය තුල එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ සාහසික ක්‍රියාවන් සම්බන්ධයෙන් මුනිවත රකී.

ජවිපෙ වැඩ පිලිවෙලෙහි වඩාත් අර්ථභාරී ලක්ෂනය වන්නේ එල්ටීටීඊයට එරෙහි යුද්ධයට සියලු සමාජ ප්‍රශ්නයන් යටත් කරන ලෙස එය කරන විවෘත කැඳවුමයි. ,ත්‍රස්තවාදය පරාජය කිරීමේ අරමුන සාක්ෂාත් කිරීම සඳහා, සේවකයින් හා හාම්පුතුන් අතර ,කාර්මික සාමය, එය විසින් කැඳවයි. ,මව්බිම සුරැකීම, සඳහා

වන තම ස්වෝත්තමවාදී උද්ඝෝෂනයේ කොටසක් ලෙස ජවිපෙ නායකයින් මේ වන විටත් වැඩ වර්ජන ගනනාවකටම විරුද්ධ වී ඇත.

ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායම් නායක විමල් වීරවංශ අගෝස්තු 20 වනදා ලක්බිම සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී මෙසේ පැවැසීයථ ,අද දවසේ අපේ රටේ කේන්ද්‍රීය ප්‍රශ්නය ත්‍රස්තවාදී ප්‍රශ්නයයි. ඒ නිසා ද්විතීයික ප්‍රශ්න විශාල ගනනාවක් යට ගැසී තිබෙනවා. රටේ වැඩිවන ජීවන වියදම නිසා මහජනතාවට විශාල බරක් දරන්නට සිදුව ඇති බව අප පිලි ගන්නවා. කෙසේ නමුදු මේ සියලු ප්‍රශ්න අභිබවමින් ත්‍රස්තවාදී ප්‍රශ්නය පෙරට පැමින තිබෙනවා.,

මහා ව්‍යාපාරිකයට ආයාචනය කරමින් වීරවංශ තර්ක කලේ යුද්ධය විසින් විදේශ ආයෝජකයින් අධෛර්යමත් නොකල යුතු බවයි. ,නීතිය සහ සාමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආන්ඩුව දැඩි පිලිවෙතක සිටිනා බැව් ගෝලීය ආයෝජකයිනට දැකිය හැකිනම් එය ඔවුන් දිරිමත් කිරීමේ එක් හේතුවක් වනු ඇත,යි ඔහු ප්‍රකාශ කලේය.

කම්කරුවන්ගේ වර්ජන ක්‍රියාවනට ජවිපෙ විරෝධය වනාහි ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහි එහි පුලුල් ප්‍රහාරයන්ගේ කොටසකි. මව්බිම සුරැකීමේ නාමයෙන් ජවිපෙ දැඩි මාධ්‍ය වාරනයකට සහාය දුන් අතර යුද්ධයට විරුද්ධවන හෝ එය විවේචනය කරන කවරෙකු හෝ පාවාදෙන්නෙකු ලෙස නම් කරමින් ඔවුනට එරෙහිව උද්ඝෝෂනයේ යෙදුනි.

රාජපක්ෂ තම හෙලෙත්තාඩු පාලක සභාගය ශක්තිමත් කර ගනුවස් ගනුදෙනු කිරීමට මාන බලන්නේ ජවිපෙ සමග පමනක් නොවේ. ඔහු අනෙකුත් දේශපාලන පක්ෂ සමගද ගනුදෙනුවක යෙදෙමින් සිටී. ආන්ඩුවට පාර්ලිමේන්තුවේ බහුතරය ලබා දෙමින්, දෙමල කතා කරන වතු කම්කරුවන් අතර පදනම්වූ ලංකා කම්කරු කොන්ග්‍රසය හා කඳුරට ජනතා පෙරමුන පසුගිය සතියේ ආන්ඩුවට එක් විය. විශාලතම විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයට ජාතික ආන්ඩුවක් සඳහා එක්වන ලෙස ජනාධිපති ඇරැයුම් කලේය.

කෙසේ නමුදු, අවසානයේදී කැබිනෙට්ටුවට එකතු වුවත් නැතත්, පසුගිය දස මාසය පුරා කල අයුරින්, ආන්ඩුවේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන උදව්කාරකයකු ලෙස ජවිපෙ දිගටම ක්‍රියාත්මක වනු ඇත.

© www.wsws.org